# 2. ජාතික ආදායම හා වියදම

## 2.1 සමස්ත උපනතීන්

1998 දී දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) මූර්ත වශයෙන් සියයට 4.7 කින් වර්ධනය විය. මෙය, 1997 දී වාර්තා වූ සියයට 6.3 වර්ධනයට සාපේක්ෂව පහළ මට්ටමක පැවතිය ද, මෙම වර්ධනය අත්පත් කර ගත්තේ නැගෙනහිර ආසියානු ආර්ථික අර්බුදයට පසුව ඇතිවූ අසතුටුදායක ජාත්‍යන්තර ආර්ථික තත්ත්වයන් මධ්‍යයේය. ලෝක ආර්ථික අවපාතයෙන් සහ නැගෙනහිර ආසියානු රටවලින් ඇතිවූ තරඟකාරිත්වයෙන්, ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන භාණ්ඩ බොහොමයකට බලපෑම් ඇතිවිය. කෙසේ වුවද, මේ සමගම නිෂ්පාදන හා ඉදිකිරීම් අංශ සඳහා ආනයනය කරන ලද යෙදවුම්වල මිල ගණන් අඩුවීමේ වාසිද විය. සමස්තයක් වශයෙන්, රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශය තුළම ආයෝජනය වර්ධනයවීම සහ පරිභෝජන වියදම ඉහළයාම හේතුවෙන් දේශීය ඉල්ලුම ශක්තිමත්ව පැවතීම, විදේශ ඉල්ලුම පහත වැටීම මගින් ඇතිවූ ඍණාත්මක බලපෑම අඩු කිරීමට උපකාරී විය.

දළ දේශීය නිෂ්පාදිතයට විදේශීය ශුද්ධ සාධක ආදායම ගැලපීමෙන් ගණනය කරනු ලබන දළ ජාතික නිෂ්පාදිතය (ද.ජා.නි.) සියයට 4.6 කින් වර්ධනය විය. ද.දේ.නි.හි වර්ධනය සමග සැසඳීමේදී ද.ජා.නි.හි මඳ වශයෙන් අඩු මට්ටමක වූ වර්ධන අනුපාතය, විදේශී ශුද්ධ සාධක ආදායමෙහි වූ පහත වැටීම නිසා සිදු විය. මෙම පහත වැටීමට, විදේශීය ආයෝජන ආදායමෙහි පහත වැටීම සහ ලාභ සහ ලාභාංශ ස්වරූපයෙන් මුදල් වැඩි වශයෙන් පිටතට ඇදීයාම හේතුවිය. 1996 සහ 1997 අතරතුර කාලයේදී එ.ජ.ඩොලර් දශලක්ෂ 37 කින් විදේශීය ශුද්ධ ආයෝජන ආදායම ඉහළයාමට ප්‍රතිවිරුද්ධව 1997 සහ 1998 අතරතුරදී එ.ජ.ඩොලර් දශලක්ෂ 19 කින් ආයෝජන ආදායම් පිටතට ඇදී යාම්හි ශුද්ධ වර්ධනයක් විය. 1998 වර්ෂය තුළදී ආයෝජන ආදායම් ලැබීම්හි මන්දගාමී වර්ධනයට ජාත්‍යන්තර පොලී අනුපාතික පහත් මට්ටමක පැවතීමද බලපෑවේය. මේ අතරතුර, 1996-98 කාලච්ඡේදය තුලදී විදේශීය සෘජු ආයෝජන අඛණ්ඩව වර්ධනය වීමට සමානුරූපීව විදේශ රටවලට ආදායම් ප්‍රේෂණ ගලා යෑම් ද විශාල වශයෙන් සිදුවිය.

පවත්නා වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන 1,015 ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇත. 1997 වර්ෂයට වඩා සියයට 1.2 ක වර්ධනයක් සහිතව 1998 දී මැදි වසර ජනගහනය දශලක්ෂ 18.8 ක් වූ බවට ඇස්තමේන්තු කර ඇත. මේ අනුව, ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය 1997 දී වූ රුපියල් 47,988 (එ.ජ.ඩොලර් 814) සිට 1998 දී රුපියල් 54,035 (එ.ජ.ඩොලර් 837) දක්වා ඉහළ ගියේය. එක් එක් රටවල ඒක පුද්ගල ආදායම සලකමින් සිදු කරන ලද ලෝක බැංකු වර්ගීකරණයට අනුව ශ්‍රී ලංකාව, ඒක පුද්ගල ආදායම එ.ජ.ඩොලර් 795 සිට එ.ජ.ඩොලර් 3,125 දක්වා වූ "පහළ මධ්‍යම ආදායම්" ලබන රටවල් සමූහය තුළට දැන් ඇතුලත්ව ඇත. ඊළඟ අවුරුදු දහය තුළදී "ඉහළ මධ්‍යම ආදායම්" ලබන රටක් වීමට නම්, රටෙහි ආර්ථික වර්ධන අනුපාතිකය සියයට 8 ක ප්‍රමාණයේ රඳවා ගතයුතු වේ. ශ්‍රී ලංකාව, සියයට 6-7 දක්වා වූ වර්ධන අනුපාතිකයක් හෝ පවත්වාගෙන යාමට අදහස් කරන්නේ නම්, ඵලදායීතාවයේ සැලකියයුතු වර්ධනයක් අත්පත් කරගනිමින්, දේශීය ආයෝජනය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 30 ක් දක්වා ඉහළ දැමිය යුතුවෙයි. ලෝක ආර්ථිකයෙහි අසතුටුදායක ප්‍රගතියත්, ආර්ථික වර්ධනයෙහි මෑතදී ඇතිවූ මන්දගාමීත්වයත් සලකන කල, මෙවැනි ස්ථාවර වර්ධනයක් කරා ළඟාවීම අපහසු බව පෙනේ. ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායම වර්ධනයවීම සලකන කල සහ විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවලට සපයන සහනදායී ආධාර පහත වැටී යාමේ වාතාවරණයක් යක් තුළ තම විදේශ සම්පත් අවශ්‍යතාවයන් සියල්ල සපුරා ගැනීම සඳහා ඉදිරියේදී සහනදායී විදේශ ආධාර සපයා ගැනීමට හැකි බවක් නොපෙනේ. එබැවින් දේශීය ඉතිරිකිරීම් සැලකියයුතු පරිදි වර්ධනය නොවන්නේ නම් අනාගත සංවර්ධන ව්‍යාපෘති සඳහා ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළෙන් විදේශීය ප්‍රාග්ධනය සපයා ගැනීමට සිදුවනු ඇත.

දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය (GDCF), දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස, 1997 දී වූ සියයට 24.4 සිට 1998 දී සියයට 25.4 ක් දක්වා වැඩිවිය. ආයෝජන අනුපාතය 1994/95 දී වාර්තාගත ඉහළ මට්ටමට ළඟා වූ අතර, 1996 දී පහත වැටී, විවෘත ආර්ථික ප්‍රතිපත්තිය පවත්වාගෙන යාම සඳහා රජයේ කැපවීම පිළිබඳව ආයෝජක විශ්වාසය ඇතිවීම නිසා නැවතත් යථා තත්ත්වයට පත්විය. ආයතනික ලාභ වර්ධනයවීම හේතුවෙන් රඳවාගත් ඉපැයීම් ඉහළයාම, පොලී අනුපාතික පහල යාම, උද්ධමනය අඩුවීම සහ ආයෝජන භාණ්ඩ මත පැනවූ අඩු ආනයන බදු ආදී සාධක දේශීය ආයෝජන කෙරෙහි සතුටුදායක ලෙස බලපෑවේය. 1997 සහ 1996 වර්ෂවලට සාපේක්ෂව විදේශීය සෘජු ආයෝජන ගලා ඒමෙහි සුළු වර්ධනයක් දක්නට ලැබුණි. 1998 සාපේක්ෂ වශයෙන් කම්කරු ආරවුල් වලින් තොර වූ වර්ෂයක් විය. උතුරු හා නැගෙනහිර පළාත් වලින් පිට ප්‍රදේශවල ආර්ථික කටයුතු බාධාවකින් තොරව ක්‍රියාත්මක විය. මෙම වර්ධනයන්ද ආයෝජක මානසිකත්වය ශක්තිමත් කිරීමෙහිලා දායක විය.

මූර්ත දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනයෙන් හතරෙන් එකකට පමණ දායක වෙමින් නිමැවුම් කර්මාන්ත අංශය මූර්ත වශයෙන් සියයට 6.3 කින් වර්ධනය විය. 1997 දී සමස්ත නිමැවුම් කර්මාන්ත නිෂ්පාදනයෙන් සියයට 78 කට දායක වූ කම්හල් කර්මාන්ත, 1998 දී සියයට 7.6 කින් ඉහළ ගිය අතර, 'දේශීය ඉල්ලුමෙහි' ඉහළ යාමට ප්‍රතිචාර වශයෙන් දේශීය වෙළෙඳපොළ අභිමුඛ කර්මාන්ත වලින් ලැබුණු විශාල දායකත්වය එයට හේතුවිය. මෙය මෑත වර්ෂවල දී නිරීක්ෂණය කරන ලද අපනයනාභිමුඛ කර්මාන්ත මුල්වූ වර්ධන රටාවට ප්‍රතිවිරුද්ධ සිදුවීමකි. රැකියා උත්පාදනයෙහි මෙන්ම ආර්ථිකයෙහි අපනයන ඉපැයුම් තුළද සැලකියයුතු දායකත්වයක් ලබාදෙන රෙදිපිළි සහ ඇඟළුම් උප අංශය, ලෝක වෙළෙඳ වර්ධනයෙහි වූ දැඩි සංකෝචනය හේතුවෙන්

තියුණු තරඟකාරිත්වයකට මුහුණ දුන්නේය. කර්මාන්ත කම්හල් වල මූර්ත නිෂ්පාදනයෙහි වර්ධනයට රෙදිපිළි, ඇඟළුම් සහ සම් භාණ්ඩ උප අංශයෙහි දයකත්වය; 1997 දී වූ සියයට 69 හා සසඳන විට 1998 දී සියයට 24 ක් පමණක් වූ අතර ඊට මෙම උප අංශයෙහි නිෂ්පාදන අපනයන වර්ධනයේ සැලකිය යුතු මන්දගාමීත්වය හේතුවිය. නිෂ්පාදන අංශයෙන් දියුණු තාක්‍ෂණය භාවිතා කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය දිරිගැන්වීම්ද ඇතුලත් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මාලාවක් මෑතදී හඳුන්වාදීම හේතුවෙන් කර්මාන්ත නිෂ්පාදන ධාරිතාව ප්‍රසාරණය වූ අතර, විවිධාංගීකරණය වූ කාර්මික පදනමක්ද ඇතිවිය. බොහෝ කාර්මික අංශවල උසස් තාක්‍ෂණයෙහි කල ආයෝජන තුළින් ඇතිවූ ඵලදායිතාවයේ වැඩි දියුණුව නිසා එම අංශවල වැටුප් සහ වේතන ඵල සාමාන්‍ය වැඩි වීම තුලින් වූ බලපෑම සටහන් කිරීමට හැකිවිය.

ඉදිකිරීම් අංශය, 1997 (සියයට 5.4) හා සැසඳීමේදී 1998 දී (සියයට 7.1) ඉහළ වර්ධන අනුපාතිකයක් වාර්තා කළේය. මෙය, බහු මහල් නේවාසික ගොඩනැගිලි, විදුලිබල උත්පාදන සහ මහා මාර්ග ව්‍යාපෘති, සංනිවේදන ජාල සහ කර්මාන්තශාලා ඉදිකිරීම් වැනි පෞද්ගලික අංශයේ ආයෝජන වර්ධනයෙන් භෞතික යටිතල පහසුකම් වර්ධනයට සම්බන්ධ රාජ්‍ය ආයෝජන වැඩිවීමේත් ඒකාබද්ධ ප්‍රතිඵලයකි.

පෙර වර්ෂවලදී මෙන්ම, දළ ජාතික නිෂ්පාදනයේ වර්ධනයට විශාලකම දයකත්වය; බලශක්තිය, ප්‍රවාහනය, සංනිවේදන, වරාය සේවාවන්, වෙළෙඳ සහ මූල්‍ය සේවා යන අංශවලින් සමන්විත සේවා අංශයේ ප්‍රසාරණයෙන් ලැබුණි. ප්‍රවාහන, වරාය සේවාවන් සහ සංනිවේදන උප අංශය සියයට 7.7 කින් වර්ධනය වෙමින් සේවා අංශයේ වූ වර්ධනයෙන් සියයට 30 ට දයක විය. පෞද්ගලික අංශයේ සහභාගිත්වයේ ඉහළයාමත් සමග දුරකථන සංනිවේදන ජාලය පුළුල් කිරීමෙන් සහ ඉහළ එකතු කළ අගයෙන් යුතු සේවාවන් සැපයීමෙන් විදුලි සංදේශ උප අංශය තවදුරටත් ඉහළ ක්‍රියාකාරිත්වයකින් යුත් අංශයක් ලෙස පැවතින. ආර්ථිකයෙහි අනෙකුත් ක්ෂේත්‍රවල ඵලදයිතා වර්ධනය හා කාර්යක්‍ෂමතාව වැඩිදියුණු කරමින් විදුලි සංදේශ අංශයෙහි වාර්තාගත වූ සියයට 46 ක වර්ධනය මෙහි ප්‍රතිඵලයකි. ප්‍රාථමික හා ද්විතීයික අංශවල ව්‍යාප්තියේ ප්‍රතිඵලයක් ලෙස භාණ්ඩ ප්‍රවාහනය ප්‍රසාරණය වීමත් සමග මාර්ගස්ථ ප්‍රවාහන සේවා සියයට 3.2 කින් වර්ධනය විය. වරාය සේවා වර්ධනය, ප්‍රතිනැව්ගත කිරීම් අඩුවීමේ හේතුවෙන්, 1997 දී වූ සියයට 16.8 සිට 1998 දී සියයට 2.5 දක්වා අඩුවිය. දේශීය ඉල්ලුමෙහි ඉහළයාමත් සමග ආනයන සහ දේශීය වෙළඳාමෙහි වූ ප්‍රසාරණය වෙළඳ සේවාවන්හි වේගවත් වර්ධනයට හේතුවිය.

පසුගිය වසර හා සැසඳීමේදී විදුලිබල, ගෑස් සහ ජල අංශය 1998 දී වේගවත් වර්ධනයක් සනිටුහන් කළේය. කාර්මික හා වාණිජ අංශ වෙතින් වැඩිවූ ඉල්ලුමට ප්‍රතිචාර වශයෙන් විදුලිය උත්පාදනය පුළුල් විය. විදුලිය සඳහා වූ ඉහළ යන ඉල්ලුම සපුරාලීම පිණිස 1996 සිට ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) සහ පෞද්ගලික යන දෙඅංශයම විදුලි බල උත්පාදන ධාරිතාව ප්‍රසාරණය කිරීම උදෙසා විශාල ආයෝජනයන් කරන ලදී. 1998 වර්ෂයේදී විදුලිය උත්පාදනය සියයට 13 කින් වැඩිවිය.

කෘෂිකාර්මික අංශය, මූර්ත වශයෙන් සියයට 2.5 ක වර්ධන අනුපාතිකයක් වාර්තා කරමින්, 1998 දී මූර්ත දළ ජාතික නිෂ්පාදිතයට සියයට 12.0 කින් දයක විය. කෘෂිකාර්මික අංශයේ වර්ධනයට වී සහ ධීවර අංශ පිළිවෙලින් සියයට 18.3 කින් හා සියයට 8.3 කින් දයක විය. ප්‍රමාණවත් ජල පහසුකම් ලැබීම හේතුවෙන් වී වගාව සඳහා යොදා ගැනුනු බිම් ප්‍රමාණය ඉහළ යෑම, පොහොර භාවිතය වැඩි කිරීම නිසා ඉහළ ඵලදාවක් ලැබීම හා 1997 වර්ෂය හා සැසඳීමේදී යහපත් කාලගුණික තත්ත්වයක් පැවතීම යනාදිය හේතුවෙන් වී නිෂ්පාදන අංශයෙහි වූ මෙම වර්ධනය අත්කරගත හැකිවිය. නැගෙනහිර වෙරළ තීරයෙහි ධීවර කටයුතු නැවත ඇරඹීම හා ජලජීවී මත්ස්‍ය නිෂ්පාදනයෙහි, ප්‍රධාන වශයෙන්ම ඉස්සන් ඇතිකිරීමෙහි ඇති වූ නිෂ්පාදන වර්ධනයන් නිසා ධීවර උප අංශයෙහි නිෂ්පාදනය ප්‍රසාරණය විය. ධීවර නිෂ්පාදන වලින් ලැබෙන අපනයන ඉපැයීම්වල සැලකියයුතු ඉහළ යාමකට මෙම සාධක ප්‍රධාන වශයෙන් හේතුවිය. පෙර වසරට වඩා සත්ව පාලනය හා එළවළු නිෂ්පාදනයෙහි වඩා හොඳ ක්‍රියාකාරිත්වයක් සහ අතුරු ආහාර භෝග නිෂ්පාදනයෙහි පහත වැටීමක් තුලින් "අනෙකුත්" කෘෂිකාර්මික අංශය මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. වැවිලි කෘෂිකාර්මික අංශයෙහි තේ නිෂ්පාදනය තවදුරටත් වර්ධනය විය. මුල් කාර්තුව තුළදී තේ මිල ගණන් ප්‍රබලව පැවතියද ලෝක සැපයුමේ ඉහළ යාමත්, රුසියාවට තේ අපනයනය කිරීමේදී ඇති වූ ව්‍යාකූල තත්ත්වයත් නිසා පසුව එය පහත වැටුණි. රබර් මිල, නිෂ්පාදන වියදමටත් වඩා පහතට වැටුණු නිසා ඇතැම් රබර් ඉඩම්වල කිරි කැපීම ලාභ රහිත වීමේ හේතුවෙන් රබර් නිෂ්පාදනය පහත වැටුණි. ඒ අතරම පොල් නිෂ්පාදනයද සියයට 3.2 කින් පමණ පහත වැටුණි.

පවත්නා සාධක පිරිවැයට අනුව දළ දේශීය නිෂ්පාදිතය සියයට 13.6 කින් ඉහළ යමින් 1998 දී රුපියල් බිලියන 913 ක් විය. ඒ අනුව, ආර්ථිකයේ සමස්ත මිල ගණන් වෙනස්වීම පිළිබිඹු කරන මිණුමක් වන දළ දේශීය අවධමනකය හෙවත් ගම්‍ය මිල දර්ශකය 1998 දී සියයට 8.4 කින් ඉහළ ගිය අතර 1997 දී එහි ඉහළ යාම සියයට 8.6 ක් විය. මෙම ප්‍රවණතාවය උද්ධමනය නිරූපණය කෙරෙන මිල දර්ශකයන්ගෙන්ද පිළිබිඹු විය.

වියදම් අංශයෙහි, පවත්නා වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය වියදම 1997 ට වඩා සියයට 13.3 ක වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් බිලියන 1,080 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. සමස්ත වියදමෙන් වැඩිම දයකත්වය නියෝජනය කරන පරිභෝජන වියදමේ ඉහළයාම සියයට 12.0 ක් විය. 1998 දී වූ සමස්ත පාරිභෝගික මිල වර්ධනයේ වූ සියයට 9.4 සමග ගැලපූ කල මෙය, මූර්ත පරිභෝජනයේ ඉහළයාමක් බව සටහන් කරයි. පෞද්ගලික පරිභෝජන වියදම මූර්ත වශයෙන් සියයට 3.0 කින් ඉහළ ගිය අතර එය නාමික වශයෙන් සියයට 16 ක වර්ධනයක් වේ. පෞද්ගලික පරිභෝජන වියදමෙහි වැඩිවීම, අළුත් යතුරුපැදි සහ මෝටර් රථ ලියාපදිංචිය, ආහාර හා බීම වර්ග කර්මාන්තවල විකුණුම් පිරිවැටුම් සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය වැනි දර්ශක තුළින් පිළිබිඹු විය. විදුලිබලය, නළ ජලය, දුරකථන, මගී ප්‍රවාහනය වැනි සේවා සඳහා වූ ගෘහස්ත අවශ්‍යතාවයන්හිද සැලකියයුතු

ප්‍රසාරණයක් පෙන්වීය. රැකියා සහ මූර්ත වේතනවල ඉහළයාමත් විදේශීය පෞද්ගලික ප්‍රේෂණයන්හි වර්ධනයත්, ඉහල වැය කළහැකි ආදායමක් ජනනය කළ අතර එය පෞද්ගලික පරිභෝජන වියදම වැඩි කිරීමට මග පෑදීය. ප්‍රධාන වශයෙන් ආරක්‍ෂක කටයුතු හා සම්බන්ධ වියදම් ඉහළයාම හේතුවෙන්, රාජ්‍ය පරිභෝජන වියදමේ වර්ධනයක් වාර්තා විය.

දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය 1998 දී සියයට 18.5 කින් වර්ධනය වෙමින් රුපියල් බිලියන 257 ක් වී යැයි ඇස්තමේන්තු කර ඇත. ප්‍රාග්ධන භාණ්ඩ ආනයනයෙහි සැලකියයුතු වර්ධනය, ඉදිකිරීම් අංශයෙහි වේගවත් වර්ධන අනුපාතිකය, විදේශීය සෘජු ආයෝජනවල වර්ධනය හා බැංකු පද්ධතිය විසින් ප්‍රදානය කරනු ලැබූ දිගුකාලීන ණයවල වර්ධනයද ඇතුලත් දර්ශක ගණනාවක් මගින් ප්‍රාග්ධන සම්පාදන ප්‍රසාරණය පිළිබිඹු විය. 1997 දී වූ රාජ්‍ය ආයෝජනය රුපියල් බිලියන 52 සිට 1998 දී රුපියල් බිලියන 68 දක්වා වර්ධනය විය. විදුලිය උත්පාදනය හා බෙදාහැරීම, කොළඹ වරාය නවීකරණය කිරීම, මාර්ග ඉදිකිරීම හා නඩත්තුව, නිවාස සහ නගර සංවර්ධනය සහ කාර්මික කලාපයන්හි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ආදිය රාජ්‍ය ආයෝජන කටයුතුවල සාපේක්‍ෂ වශයෙන් විශාල පිරිවැයක් සහිත ව්‍යාපෘතීන් විය. රාජ්‍ය ආයෝජන ඉහළයාමේ සාධකය මත, විදේශීය දිගුකාලීන ණය ගැනුම් සැලකිය යුතු අන්දමින් ඉහළ ගියේය.

දළ දේශීය ඉතිරිකිරීම් අනුපාතය 1997 දී වූ සියයට 17.3 සිට 1998 දී සියයට 18.9 දක්වා ඉහළ යෑම තවත් හිතකර වර්ධනයක් විය. ප්‍රධාන වශයෙන්ම ඉහළ තලයක පැවති සමාගම් ඉතිරිකිරීම් හේතු කොටගෙන පෞද්ගලික අංශය තුලින් ඉහළ ඉතිරිකිරීම් අනුපාතිකයකට දායකත්වය ලැබුනු අතර ආදායමේ අඩුවීම හා වර්තන වියදම් වල ඉහළ

**2.1 සංඛ්‍යා සටහන**

**ස්ථාවර (1996) සාධක වියදම් මිල අනුව දළ ජාතික නිෂ්පාදිතයේ ආංශික සංයුතිය සහ වර්ධනය**

| අංශය | වැඩිවීමේ අනුපාතය % | | ද.ජා.නි.හි වැඩිවීමෙහි ප්‍රතිශතක දායකත්වය | | ද.ජා.නි.හි ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|
| | 1997(අ) | (1998(අ) | 1997(අ) | (1998(අ) | 1997(අ) | 1998(අ) |
| 1. කෘෂිකර්මය, දව ආදී වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තය | 3.0 | 2.5 | 10 | 11.9 | 22.0 | 21.5 |
| කෘෂිකර්මය | 2.9 | 1.8 | 7.6 | 6.6 | 17.3 | 16.8 |
| තේ | 7.1 | 1.1 | 1.6 | 0.4 | 1.5 | 1.5 |
| රබර් | -5.4 | -9.0 | -0.5 | -1.0 | 0.5 | 0.5 |
| පොල් | 3.3 | -3.2 | 0.9 | -1.3 | 1.8 | 1.7 |
| වී | 11.2 | 18.3 | 4.8 | 11.9 | 3.0 | 3.4 |
| අනෙකුත් | 0.5 | -1.5 | 0.7 | -3.4 | 10.4 | 9.8 |
| දව ආදී වන ද්‍රව්‍ය | 1.3 | 1.2 | 0.4 | 0.5 | 2.0 | 2.0 |
| ධීවර | 5.0 | 8.3 | 2.0 | 4.8 | 2.7 | 2.8 |
| 2. පතල් හා කැනීම් කටයුතු | 3.8 | -5.4 | 1.2 | -2.3 | 2.0 | 1.8 |
| 3. නිමැවුම් කර්මාන්ත | 9.1 | 6.3 | 22.1 | 22.9 | 16.8 | 17.1 |
| තේ, රබර් සහ පොල් මද නිෂ්පාදන සැකසීම | 3.5 | -1.2 | 1.2 | -0.6 | 2.3 | 2.2 |
| නිෂ්පාදන කර්මාන්ත | 10.3 | 7.6 | 19.5 | 21.7 | 13.2 | 13.6 |
| කුඩා කර්මාන්ත | 7.0 | 6.5 | 1.3 | 1.8 | 1.3 | 1.3 |
| 4. ඉදිකිරීම් | 5.4 | 7.1 | 5.6 | 10.6 | 7.0 | 7.1 |
| 5. විදුලිය, ගෑස්, ජලය හා සනීපාරක්‍ෂක සේවා | 8.1 | 10.1 | 1.6 | 2.9 | 1.4 | 1.4 |
| එයින් : | | | | | | |
| විදුලිය | 8.4 | 9.8 | - | - | - | - |
| 6. ප්‍රවාහනය, ගබඩා කිරීම හා සංනිවේදනය | 8.8 | 7.7 | 14 | 18.2 | 11.0 | 11.3 |
| එයින් : | | | | | | |
| සංනිවේදනය | 31.6 | 45.8 | | | | |
| 7 තොග සහ සිල්ලර වෙළඳම | 6.3 | 4.5 | 21.2 | 21.6 | 22.6 | 22.5 |
| ආනයනය | 9.6 | 8.2 | 13.4 | 17.0 | 9.7 | 10.0 |
| අපනයනය | 12.0 | 0.1 | 4.2 | 0.1 | 2.5 | 2.4 |
| දේශීය | 2.2 | 2.0 | 3.6 | 4.6 | 10.4 | 10.1 |
| 8. බැංකු රක්‍ෂණ සහ නිශ්චල දේපල | 10.3 | 6.4 | 11 | 10.2 | 7.5 | 7.6 |
| 9. නිවාස අයිතිය | 1.3 | 1.2 | 0.4 | 0.5 | 2.0 | 1.9 |
| 10. රාජ්‍ය පරිපාලන හා ආරක්‍ෂක කටයුතු | 5.2 | 3.0 | 4.0 | 3.3 | 5.1 | 5.0 |
| 11. සේවා (අන් තැනක සඳහන් නොවන) | 6.1 | 3.7 | 3.6 | 3.1 | 4.0 | 4.0 |
| 12. දළ දේශීය නිෂ්පාදිතය | 6.3 | 4.7 | 94.7 | 103.1 | 101.2 | 101.3 |
| 13. විදේශීය ශුද්ධ සාධක ආදායම | | | 5.3 | -3.1 | -1.2 | -1.3 |
| 14. දළ ජාතික නිෂ්පාදිතය | 6.8 | 4.6 | 100.0 | 100.0 | 100.0 | 100.0 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

යෑම නිසා රාජ්‍ය අංශයේ සෘණ ඉතිරිකිරීම් වැඩිවිය. ජාතික ඉතිරිකිරීම් අනුපාතිකය 1997 වර්ෂයේදී වූ සියයට 21.5 සිට 1998 වර්ෂයේදී සියයට 23.2 දක්වා ඉහළ ගියේය. ආයෝජන - ඉතිරිකිරීම් පරතරය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.2 දක්වා අඩු වූ අතර, එම හිඟය විදේශීය සෘජු ආයෝජන හා දිගුකාලීන ණයදීම් තුළින් පියවා ගැණුනි. මෑත වසරවලදී ජාතික ඉතිරිකිරීම්වල දිරිගන්වන සුළු ප්‍රගතියක් පෙන්නුම් කළද, එය අපේක්ෂිත ආයෝජන තලයට වඩා අඩුවන අතර බොහෝ ආසියාතික රටවල් ළඟා කරගත් ඉහළ අනුපාතයන්ට වඩා බෙහෙවින් පහත් මට්ටමක විය.

## 2.2 ආංශික උපනතීන්

කර්මාන්ත නිෂ්පාදන, වැවිලි භෝග සැකසීම සහ කුඩා කර්මාන්ත ඇතුලත් නිමැවුම් කර්මාන්ත අංශය, 1997 දී වාර්තා කළ සියයට 9.1 වර්ධනයට සාපේක්ෂව 1998 දී සියයට 6.3 කින් වර්ධනය විය. වර්ධන වේගය මන්දගාමී වීම, ප්‍රධාන වශයෙන් එතෙරින් වූ ඉල්ලුම අඩුවීම නිසා අපනයනාභිමුඛ කර්මාන්තවලත්, පොල් සහ රබර් නිෂ්පාදනයේ ඇතිවූ පහත වැටීමේ හේතුවෙන් වැවිලි භෝග සැකසීමෙහිත් පිළිබිඹු විය. 1997 වර්ෂයෙ දී නිෂ්පාදන අංශයෙහි එකතු කළ අගයෙන් සියයට 78 කටම වාගේ හිමිකම් පෑ නිමැවුම් කර්මාන්ත උප අංශය, පසුගිය වර්ෂයේදී වූ සියයට 10.3 ට සාපේක්ෂව 1998 වර්ෂයේදී සියයට 7.6 කින් වර්ධනය විය. ලෝක මූල්‍ය අර්බුදය සහ භාණ්ඩ මිළ පහත වැටීම හේතුවෙන් වර්ෂය තුළදී ලෝක වෙළඳමෙහි තියුණු පහත වැටීම නිසා ඇතිවූ අයහපත් බාහිර සාධක, 1998 දී මෙම අංශයෙහි ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස බලපෑවේය. ආහාර, පාන වර්ග සහ දුම්කොළ; රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ සහ රසායනික, ඛණිජ තෙල්, ප්ලාස්ටික් සහ රබර් නිෂ්පාදන යන කාණ්ඩ වල නිෂ්පාදනය වැඩිවීම 1998 වර්ෂය තුළදී නිමැවුම් කර්මාන්ත අංශයේ වූ වර්ධනයෙන් සියයට 75 කට පමණ දයකවිය. ප්‍රධාන වශයෙන් සකස් කළ ධාන්‍ය ආහාර, සැකසූ මස් නිෂ්පාදන සහ පාන වර්ග වලට දේශීය ඉල්ලුම අධික වීම නිසා ආහාර, පානවර්ග හා දුම්කොළ අංශයෙහි 1997 දී වූ සියයට 3.4 සිට 1998 සියයට 9.6 දක්වා වර්ධනයක් සිදුවිය. විශේෂයෙන් ඛණිජ තෙල් නිෂ්පාදන ධාරිතාවෙහි වැඩිවීම හේතුකොටගෙන; රසායනික, ඛණිජතෙල්, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ උප අංශය සියයට 13.1 කින් වර්ධනය විය. පසුගිය වසරේදී සිරිත් පරිදි කෙරෙන නඩත්තු කටයුතු සඳහා මාස දෙකක කාලයකට වසා තැබුණු නමුත් ඛණිජ තෙල් පිරිපහදුවෙහි නිෂ්පාදන කටයුතු 1998 වර්ෂය පුරාම අඛණ්ඩව සිදු කෙරුණි. ඉදිකිරීම් කටයුතුවල ප්‍රසාරණය හේතුවෙන් පී. වී. සී. නළ සහ උපාංග වල ඉල්ලුම, තීන්ත සහ රසායනික වලට ඇති ඉල්ලුම වර්ධනය වූ අතර ප්‍රධාන වශයෙන් ඇහලුම් කර්මාන්තයෙන් ප්ලාස්ටික් හා පොලිතින් නිෂ්පාදන වලට තිබූ ඉල්ලුම මෙම උප අංශයෙහි වර්ධනයට දයක විය. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් හා සම්භාණ්ඩ උප අංශයෙහි වූ වර්ධන අනුපාතය සැලකියයුතු අන්දමින් අඩුවීම කෙරෙහි නැගෙනහිර ආසියානු මූල්‍ය අර්බුදය හේතු කොටගෙන ඇති වූ අසතුටුදයක විදේශීය සාධක බලපෑවේය. ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදනයෙහි, ප්‍රධාන වශයෙන් සිමෙන්ති, සෙවිලි ද්‍රව්‍ය සහ පිහන් ගඩොල් ආදියෙහි වූ වර්ධනය; ලෝහ නොවන ඛණිජ නිෂ්පාදන කාණ්ඩයෙහි ඉහළ වර්ධන අනුපාතිකය කෙරෙහි බලපෑවේය. රබර් සහ පොල් කර්මාන්තයෙහි වූ පසුබෑම, සැකසුම් කර්මාන්තය කෙරෙහි බලපෑවේය.

ඉදිකිරීම් අංශය 1997 වර්ෂයේදී වූ සියයට 5.4 ක වර්ධනයට සාපේක්ෂව 1998 දී සියයට 7.1 කින් වර්ධනය විය. රට තුළ නිවාස ඉදිකිරීම් සහ අනෙකුත් යටිතල සංවර්ධන ව්‍යාපෘති සඳහා පෞද්ගලික අංශයේ සහභාගිත්වය දිරිමත් කිරීමට 1998 අයවැය ලේඛනයෙන් දුන් අනුග්‍රහ හේතුවෙන් මෙම අංශයෙහි වර්ධනය වේගවත් විය. මීට අමතරව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාවට නංවනු ලැබූ රාජ්‍ය අංශයේ නිවාස වැඩ සටහන 1998 දී සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කළේය. සිමෙන්ති, ඇස්බැස්ටෝස්, වානේ සහ පී.වී.සී. ගොඩනැගිලි ද්‍රව්‍යවල අලෙවිය වැඩිවීම තුළින්ද ඉදිකිරීම් අංශයේ වර්ධනය පෙන්නුම් කෙරිණි. නිවාස සහ දේපල සංවර්ධනය කිරීම සඳහා වාණිජ බැංකු විසින් දෙන ලද මුළු අත්තිකාරම් ප්‍රමාණය 1998 මුල් මාස නමය තුළදී රුපියල් බිලියන 5.8 දක්වා ඉහළ ගිය අතර 1997 වර්ෂයේ අදළ කාලය තුලදී එම ප්‍රමාණය වූයේ රුපියල් බිලියන 1.6 ක් පමණකි.

සමස්ත සේවා අංශය එනම් විදුලිය, ගෑස් සහ ජල අංශය අනෙකුත් සියළු අංශයන්ට සාපේක්ෂව වඩා යහපත් ලෙස ක්‍රියාත්මක විය. 1997 වර්ෂයේ දී වූ සියයට 8.1 ක වර්ධනය සමග සැසඳීමේදී එය සියයට 10.1 ක ඉහළ වර්ධන අනුපාතයක් සටහන් කළේය. මෙම අංශයේ ප්‍රමුඛත්වය දරණ විදුලිය උප අංශය, වාර්ෂිකව සියයට 10 ක සාමාන්‍ය ඉහළ යන ඉල්ලුමක් පවතිද්දී වුවද, බාධා රහිත බල සැපයුමක් පවත්වාගෙන යාමට සමත් විය. තාප විදුලි බල උත්පාදනය, විදුලි බල මණ්ඩලය සහ පෞද්ගලික අංශය යන දෙපාර්ශවයම යටතේ ව්‍යාප්ත වීමත්, ජල සැපයුම නොමඳව ලැබීමේ හේතුවෙන් ජල විදුලි බල උත්පාදනය සැලකිය යුතු ඉහළ මට්ටමකින් වැඩිවීමත් මෙම වර්ධනයට හේතු විය. ස්ථාපිත විදුලිබල ධාරිතාවය, 1997 දී වූ මෙගවොට් පැය 1586 සිට 1998 දී මෙගවොට් පැය 1626 දක්වා වර්ධනය විය. විදුලිබල උත්පාදනය සඳහා පෞද්ගලික අංශයෙහි දයකත්වය තවදුරටත් වැඩිදියුණු වෙමින් පැවතියේය.

ප්‍රවාහනය, ගබඩාකිරීම සහ සංනිවේදන උප අංශය 1998 වර්ෂයේදී සියයට 7.7 කින් වර්ධනය විය. 1998 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගයෙහි පහළ යෑමක් සිදු වුවද; ප්‍රවාහන, ගබඩාකිරීම හා සංනිවේදනය උප අංශය සිය වර්ධන වේගය නොවෙනස්ව පවත්වාගෙන ගොස් ඇත. සමස්ත දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය සඳහා මෙම උප අංශයෙහි දයකත්වය 1997 වර්ෂයේදී වූ සියයට 14.0 සිට 1998 වර්ෂයේදී සියයට 18.2 දක්වා ඉහළ ගොස් ඇත. වරාය සේවාවන් මගින් එකතු කළ අගයෙහි වර්ධනය 1997 දී සියයට 16.8 සිට 1998 දී සියයට 2.5

දක්වා අඩුවිය. ප්‍රවාහන අංශයෙහි එය 1997 දී වූ සියයට 5.7 සිට 1998 දී සියයට 4.4 ක් දක්වා අඩුවිය. 1998 දී විදුලි සංදේශ අංශයේ ඇතිවූ ඉහළ වර්ධනය අනෙක් අංශ දෙකේ ඇතිවූ පහත වැටීම සමහන් කර මුළු වර්ධන වේගය නොවෙනස්ව පවත්වා ගැනීමට ඉවහල් විය. විදුලි සංදේශ අංශයේ වර්ධන අනුපාතය, 1997 දී සියයට 31.6 සිට 1998 දී සියයට 45.8 දක්වා සැලකිය යුතු මට්ටමකට ඉහළ ගොස් ඇත.

රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ තරඟකාරිත්වය ඔස්සේ විදුලි සංදේශ කර්මාන්තය වැඩි වේගයකින් වර්ධනය වීම අඛණ්ඩව සිදුවූ අතර, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය හා පෞද්ගලික අංශයේ විදුලි සංදේශ ආයතනවල සංවර්ධන ව්‍යාපෘතීන්හි ධාරිතාවය පුළුල්වීම මීට හේතුවිය. මෙම වැඩිවීමේ ප්‍රවණතාවය 1997 හා 1998 වසර පුරාම දක්නට ලැබුණි. 1998 වසර තුළදී අළුතෙන් දුරකථන 143,000 ක් පමණ සැපයීමට ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමත් විය. අනිකුත් සියළුම පෞද්ගලික අංශයේ සපයන්නන්ගෙන් විවිධ සේවාවන් ලබාගන්නා දයකයන්ගේ සංඛ්‍යාව 124,000 කින් පමණ වර්ධනය විය. විදුලි සංදේශ සේවා කර්මාන්තයේ සමස්ත ආයෝජන ප්‍රමාණය 1998 වසර තුළදී සැලකිය යුතු ලෙස වැඩිවිය. විදුලි සංදේශ සේවා පුළුල් කිරීමේ ව්‍යාපෘති, දුරකථන ඝනත්වය තවදුරටත් වැඩිදියුණුවීම සඳහා මුල් විය. ඒ අනුව, 1997 වසරේදී එක් දුරකථනයක් සඳහා 59 ක් වූ පුද්ගලයන් ගණන 1998 දී පුද්ගලයන් 41 දක්වා අඩු කරමිනි. දයක වූ පුද්ගලයන්ගේ සංඛ්‍යාව අනුව වූ කර්මාන්තයේ ව්‍යාප්තවීමට අමතරව, වැඩිවන තරඟකාරී බව නිසා සේවාවන්ගේ ගුණාත්මක තත්ත්වයද වැඩිදියුණු විය. තැපැල් සේවාවද සේවාවන්ගේ විවිධත්වය හා ඒවායේ ගුණාත්මකභාවය අනුව වර්ධනය විය. විද්‍යුත් තැපැල් (E Mail) පහසුකම් වැනි නව සේවාවන්ද 1998 වර්ෂයේ දී තැපැල් දෙපාර්තමේන්තුව විසින් සපයන ලදී.

මඟී හා භාණ්ඩ ප්‍රවාහන යන දෙඅංශයන්ගෙන් සමන්විත ප්‍රවාහන උප අංශය තුළ මාර්ග, දුම්රිය හා ගුවන් යනුවෙන් කොටස් තුනක් වේ. 1998 දී මෙම අංශ තුනේම ඒකාබද්ධ වර්ධනය සියයට 3.2 ක් විය. මාර්ගස්ථ භාණ්ඩ ප්‍රවාහනයට සම්බන්ධ ප්‍රවාහන කටයුතු සමස්ත ප්‍රවාහන අංශයේ ඉහළින්ම සිටින අතර එය කෘෂිකාර්මික, පතල් හා කැණීම්, නිමැවුම් කර්මාන්ත, ඉදිකිරීම් යන අංශවල කටයුතු සමග විශාල වශයෙන් සම්බන්ධ වේ. දේශීය හා ජාත්‍යන්තර කරුණු හේතුවෙන් ඉදිකිරීම් අංශයේ හැරුණු විට ඉතිරි සියළුම අංශවලට සම්බන්ධ කටයුතුවල වර්ධන වේගයේ අඩුවීමක් දක්නට ලැබිණ. මෙය මාර්ගස්ථ භාණ්ඩ ප්‍රවාහනය කෙරෙහි අහිතකර ලෙස බලපෑ අතර 1997 වර්ෂයට සාපේක්ෂව එම අංශයේ වර්ධන වේගය අඩුවීමටද හේතු විය.

වරාය සේවා කටයුතු සම්බන්ධව 1998 වර්ෂයේ දී වර්ධනය අඩුවීමේ ප්‍රවණතාවය පෙන්වීය. මෙම අංශයේ කටයුතු ප්‍රධාන වශයෙන් නැව් භාණ්ඩ හැසිරවීමේ ප්‍රමාණය මත රඳා පවතී. 1998 වසරේදී දේශීය නැව් භාණ්ඩ හැසිරවීම ඉතා සුළු වශයෙන් පහත වැටුණු අතර ප්‍රතිනැව්ගත කිරීම් ඉහළ ගියේ සියයට 2.0 කින් පමණකි. දේශීය නැව් භාණ්ඩ හැසිරවීම් අඩුවීමට හේතු වූයේ නිර්යාත වර්ධනයේ වූ පහත වැටීමයි. නැගෙනහිර ආසියානු මූල්‍ය අර්බුදය හා රුසියානු රූබල් අර්බුදයේ අහිතකර ප්‍රතිඵල නිසා ඇතිවූ ආයාත හා නිර්යාත ප්‍රමාණයේ පහත වැටීම, පිටතින් පැමිණෙන නැව් භාණ්ඩ හැසිරවීම කෙරේ බලපෑම් කරන ලදී. කලාපීය ආර්ථික ගැටළු හා කලාපය තුළ වරාය පහසුකම් සැපයීම සඳහා උද්ගත වෙමින් පවතින තරඟයද ප්‍රතිනැව්ගත කිරීමේ කටයුතු කෙරේ බලපා ඇත. කොළඹ වරායට සම්බන්ධ නාවික මාර්ගවලට සමීප, නවීන පහසුකම් වලින් යුක්ත අළුත් වරායක් ඕමානයේ සලාලාහි පිහිටුවීම, ඇතැම් ප්‍රතිනැව්ගත කිරීම් ශ්‍රී ලංකාවට අහිමි වීමට හේතුවී ඇත. මෙවැනි නවීන වරායන් තවදුරටත් ව්‍යාප්තවීමත් සමග ශ්‍රී ලංකාවේ වරායන්හි ධාරිතාවය සහ ඵලදායීතාවයද තවදුරටත් වැඩි නොකළහොත් නැව් භාණ්ඩ හැසිරවීම හා සම්බන්ධ වූ වැඩිවන අභියෝගයන්ට මුහුණ දීමට ශ්‍රී ලංකාවට සිදුවනු ඇත.

සිය ආයාත හා නිර්යාත වටිනාකම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට හැත්තෑවක් පමණ වන තත්ත්වයක් තුළ ශ්‍රී ලංකාව වෙළඳ කටයුතු මත ඉතා දැඩි සේ රඳා පවතින රටක් වන අතර, වෙළඳාම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 23 කට දායක වෙමින් ආර්ථිකයේ ප්‍රධාන කාර්යභාරයක් ඉටුකිරීම ඉතා ස්වාභාවික කරුණක් වෙයි. 1998 වර්ෂයේදී එය දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයෙන් සියයට 22 කට දයක විය. කෙසේවුවත්, ආයාත, නිර්යාත හා දේශීය වෙළඳම ඇතුලත් වන වෙළඳ අංශය, 1997 වසරේදී වූ සියයට 6.3 වර්ධනයට සාපේක්ෂව 1998 දී සියයට 4.5 ක අඩු වර්ධන අනුපාතයක් වාර්තා කර ඇත. මෙම අඩු වර්ධන අනුපාතිකයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ

**2.2 සංඛ්‍යා සටහන**

**අනෙකුත් කෘෂිකාර්මික උප අංශයේ සංයුතිය**

| අංශය | 1996 ස්ථාවර මිල අනුව එකතු කළ වටිනාකම (රු.දශලක්ෂ) | | |
|---|---|---|---|
| | 1996(අ) | 1997(අ) | 1998(අ) |
| එළවළු | 31,189 | 31,676 | 33,126 |
| අතුරු ආහාර භෝග (ආ) | 19,712 | 18,501 | 15,577 |
| සුළු අපනයන භෝග (ඇ) | 7,137 | 7,874 | 7,825 |
| උක්ගස් | 1,260 | 1,203 | 1,202 |
| දුම්කොළ | 1,496 | 1,553 | 1,569 |
| සත්ව පාලනය (ඈ) | 6,065 | 6,293 | 6,560 |
| අනෙකුත් | 8,662 | 8,763 | 8,837 |
| එකතුව | 75,521 | 75,863 | 74,696 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

(ආ) අතුරු ආහාර භෝග කාණ්ඩය ප්‍රධාන වශයෙන් අර්තාපල්, මිරිස්, රතුළූණු, ලොකුළූණු, මුංඇට, කව්පි, කුරක්කන් ඇතුළු අනෙකුත් අතුරු ආහාර භෝග වලින් සමන්විත වේ.

(ඇ) සුළු අපනයන භෝග කාණ්ඩය ප්‍රධාන වශයෙන් කෝපි, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, කජු, බුලත් හා අනෙකුත් සුළු අපනයන භෝග වලින් සමන්විත වේ.

(ඈ) සත්ව පාලන කාණ්ඩය ප්‍රධාන වශයෙන් කිරි, බිත්තර, කුකුල් මස් හා අනෙකුත් මස් නිෂ්පාදන කටයුතුවල එකතු කළ අගයන්ගෙන් සමන්විත වේ.

ජාත්‍යන්තර වෙළඳම සංකෝචනය වීමයි. නිර්යාත වෙළෙඳ උප අංශය, 1997 දී සියයට 12.0 ක් වූ වර්ධන අනුපාතය හා සසඳන විට 1998 දී සියයට 0.1 කින් පමණක් වර්ධනය විය. වෙළඳ අංශයෙන් සියයට 42 කට හිමිකම් දක්වන ආයාත වෙළඳ උප අංශයේ මූර්ත එකතු කළ අගය, 1997 දී වූ සියයට 9.6 හා සසඳන විට 1998 දී සියයට 8.2 කින් වැඩිවිය. මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් සහල් (සියයට 42.4), සීනි (සියයට 29.6), මත්ස්‍ය නිෂ්පාදන (සියයට 7.0) සහ අතරමැදි භාණ්ඩ වන පොහොර (සියයට 7.0), ඛනිජ තෙල් නිෂ්පාදන (සියයට 36.1) සහ තිරිඟු (සියයට 8.0) වැනි ආනයනයන්ගේ පහත වැටීම හේතුවිය. දේශීය වෙළඳ උප අංශය, 1997 වසරේ මෙන්ම 1998 වසරේදීද සියයට 2 කින් වර්ධනය විය. ආර්ථිකයේ ප්‍රාථමික හා ද්විතීයික අංශවල නිමැවුම් වර්ධනයේ අඩුවීම, මෙම අංශයේ මන්දගාමී වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතුවිය.

බැංකු, රක්ෂණ හා නිශ්චල දේපල අංශය, 1997 දී වූ සියයට 10.3 කට සාපේක්ෂව 1998 දී සියයට 6.4 කින් වර්ධනය විය. වාණිජ බැංකුවල ලාභදායී බව කෙරේ විදේශ වෙළඳාමේ පහත බැසීම සුළු වශයෙන් හේතු වී ඇත. විශේෂයෙන්ම රුසියානු අර්බුදයේ බලපෑම, 1998 වර්ෂයේ අවසාන කාර්තුවේ ලාභ ප්‍රමාණය පහත වැටීමට හේතුවිය. මීට අමතරව, අඩු ක්‍රියාකාරී බවක් පෙන්වූ කොටස් වෙළෙඳපල කටයුතු නිසා කොටස් තැරැව් කටයුතු මගින් ඉපැයූ ලාභද පහත වැටිණ.

සංචාරක උප අංශය 1998 වර්ෂයේදී සියයට 4.1 ක මූර්ත වර්ධනයක් පෙන්නුම් කළේය. සියයට 4 ක වර්ධනයක් පෙන්නුම් කරමින් 1998 වර්ෂය තුළ සංචාරකයන්ගේ පැමිණීම 381,063 ක් විය. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ ආසියානු ආර්ථික අර්බුදයේ බලපෑම හේතුවෙන් පහත වැටුණු ආසියානු කලාපීය සංචාරකයන්ගේ පැමිණීම සමහන් කරමින්, මුළු සංචාරකයන්ගේ සංඛ්‍යාවෙන් සියයට 60 ක් වූ, බටහිර යුරෝපීය සංචාරකයන්ගේ පැමිණීමයි. සංචාරක කර්මාන්තයෙන් ලද දළ ඉපැයීම් 1998 දී සියයට 10 කින් වර්ධනය වෙමින් ඇ.එ.ජ.ඩොලර් දශලක්ෂ 230 ක් ලෙසින් වාර්තා වී ඇත. වර්ගීකරණය කරන ලද හෝටල් කාමර පරිහරණයද 1997 දී වූ සියයට 49 සිට 1998 දී සියයට 53 ක් දක්වා වැඩිවිය. මෙම උප අංශයේ වර්ධන වේගය පවත්වා ගැනීම සඳහා දේශීය සංචාරක කටයුතුවල වූ අඛණ්ඩ වැඩිවීමද දයක වී ඇත. 1997 ට සාපේක්ෂව, දේශීය සංචාරකයන් නවාතැන් ගත් රාත්‍රී ගණන 1998 දී සියයට 15 කින් වැඩිවිය.

වන සම්පත් හා ධීවර කටයුතු ඇතුලත් කෘෂිකාර්මික අංශයේ එකතු කළ අගය මූර්ත වශයෙන් සියයට 2.5 කින් වැඩිවූයේ ප්‍රධාන වශයෙන් වී වගාව සහ ධීවර කටයුතුවල වූ වර්ධනය හේතුවෙනි. කෘෂිකාර්මික අංශයේ වඩාත්ම වැදගත් භෝගය වන වී, 1997/98 මහ සහ 1998 යල කන්නවල වැඩිවූ අස්වැන්න හේතුවෙන් 1998 දී සියයට 18.3 කින් වැඩිවිය. වී නිෂ්පාදනයේ වැඩිවීම, සහල් මිල ඉතා සුළුවෙන් පහළ බැසීමට හා සහල් ආනයන කිරීමේ අවශ්‍යතාවය අඩු කිරීමට හේතුවිය.

කෙසේ වුවද, සමස්ත වැවිලි කෘෂිකර්මය තුළ මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් දක්නට ලැබිණ. වැවිලි භෝග තුන අතරින් තේ නිෂ්පාදනය, 1997 දී වූ සියයට 7 හා සසඳන විට සියයට 1 ක සුළු වැඩිවීමක් පෙන්නුම් කරයි. තේ නිෂ්පාදනය වාර්තාගත අන්දමින් 1998 දී කිලෝ දශ ලක්ෂ 280 දක්වා වැඩි වුවද, ලෝක වෙළෙඳපොළේ සැපයුම් තත්ත්වය වැඩිවීම හා සමග බැඳුණු රුසියානු අර්බුදය හේතුවෙන් වසරේ අවසාන භාගයේදී පහත මට්ටමක පැවති මිල ගණන් මෙම උප අංශයේ ක්‍රියාකාරිත්වයට තර්ජනයක් වී ඇත. ප්‍රධාන වශයෙන් ආසියානු අර්බුදයේ අහිතකර ප්‍රතිඵල හේතුවෙන් රබර් උප අංශයේ එකතු කළ අගය දෙවැනි වසරටත් 1998 දී සියයට 9 කින් අඛණ්ඩව පහත වැටුනි. පොල් නිෂ්පාදන උප අංශය 1997 දී සියයට 3 ක් වූ වැඩිවීමට ප්‍රතිවිරුද්ධ ලෙස 1998 දී සියයට 3 ක පහත වැටීමක් පෙන්නුම් කරයි. අහිතකර දේශගුණික තත්ත්වයන් මෙන්ම නිවාස සෑදීම වැනි වෙනත් කටයුතු සඳහා පොල් වගා කළ ඉඩම් යොද ගැනීම වැඩිවීමද වැනි කරුණු මීට හේතු වීමට පුළුවන.

අනිකුත් සියළුම කෘෂිකාර්මික කටයුතු ඇතුළත්, අනෙකුත් උප අංශය, සමස්ත කෘෂිකාර්මික අංශයට සියයට 50 කට වඩා වැඩි ප්‍රමාණයකින් දායක වෙයි. 1998 වර්ෂයේදී මෙම උප අංශයේ ඒකාබද්ධ වර්ධනය ඍණ අගයක් ගනී. මෙම උප අංශය තුළ එළවළු නිෂ්පාදනයේ එකතුකළ අගය සියයට 5 කින් වැඩිවී ඇත. සත්ව පාලන කටයුතුද සියයට 4 කින් වැඩිවූයේ ප්‍රධාන වශයෙන් කුකුළු ගොවිපල නිෂ්පාදනයන්හි ඉහළ ක්‍රියාකාරිත්වය හේතුවෙනි. කෙසේ වුවද, අර්තාපල්, ළූණු, මිරිස් වැනි අතුරු ආහාර භෝගවල සියයට 16 ක සැලකියයුතු පහත වැටීම හා සුළු අපනයන භෝගවල ඉතා කුඩා පහත වැටීම, එළවළු හා සත්ව පාලන අංශ වලින් වූ වැඩිවීම අභිබවා ගොස් ඇත. අඩු මිල ගණන් සහිත ආනයනයන්ගේ සුලබතාවය අතුරු ආහාර භෝග අංශයේ දුර්වල ක්‍රියාකාරිත්වයට මූලික හේතුව වී ඇත.

1998 දී සියයට 8.3 ක වැඩිවීමක් දක්වමින් ධීවර අංශයේ යහපත් ක්‍රියාකාරිත්වයක් පෙන්වයි. මම වැඩිවීම, මුහුදු මත්ස්‍ය නිෂ්පාදන හා ජලජීවී මත්ස්‍ය නිෂ්පාදන යන අංශ දෙකෙන්ම ලැබුවකි. මුහුදු මත්ස්‍ය නිෂ්පාදනයේ වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත්තේ නැගෙනහිර පලාතේ වෙරළාසන්න මසුන් ඇල්ලීමේ කටයුතු නැවත ආරම්භ කිරීමය. රජයේ දිරිගැන්වීම් හා ධීවර වරායන් වැනි යටිතල පහසුකම් වැඩිකිරීමද නිෂ්පාදන වැඩිවීම කෙරේ දයක වී ඇත. ජලජීවී මත්ස්‍ය නිෂ්පාදනයේ වැඩිවීමට හේතුවූයේ නිෂ්පාදනයට අදළ යෙදවුම්වල ඉතා හොඳ සැපයුම හා උසස් කළමනාකාරිත්වයයි. 1998 මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදනවල නිර්යාත ඉපැයීම්වලවූ සියයට 45 ක වැඩිවීම මගින් මෙම වර්ධනය පිළිබිඹු කෙරේ.

පතල් හා කැණීම් අංශය 1998 වර්ෂයේදී පහත වැටීමක් පෙන්වයි. ජපානයෙන් හා නැගෙනහිර ආසියාවෙන් මැණික් හා අර්ධ වටිනා ගල් සඳහා ඇතිවූ ඉල්ලුමේ පහත වැටීම පතල් උප අංශය කෙරේ අයහපත් ලෙස බලපා ඇත.

1998 දී මැණික් අපනයනය කිරීමෙන් ලද ආදයම, 1997 වසරේ ආදයමට හා සාපේක්ෂව සියයට 34 කින් පහත වැටීමක් පෙන්වයි. ආරක්‍ෂක කරුණු හේතුවෙන්, බනිජ වැලි මුහුදු මාර්ග ඔස්සේ ප්‍රවාහනය කිරීම හා පතල් මෙහෙයුම් නිදහස්ව කිරීම වැලකිණ. කෙසේ වුවද, කැණීම් උප අංශයේ යහපත් ක්‍රියාකාරිත්වය මෙම අහිතකර තත්ත්වය තරමක් දුරට සමහන් කිරීමට හේතුවිය. කැණීම් අංශයේ යහපත් ක්‍රියාකාරිත්වය ප්‍රධාන වශයෙන් ඉදිකිරීම් කටයුතු වැඩිවීමේ ප්‍රතිඵලයකි.

## 2.3 වියදම

දේශීය ආර්ථික ක්‍රියාවලිය විසින් ජනනය කරනු ලබන සමස්ත ඉල්ලුම මණිනු ලබන්නේ ආර්ථිකයෙහි පෞද්ගලික හා රාජ්‍ය අංශයන්හි පරිභෝජන සහ ආයෝජන (දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය) වියදමෙහි එකතුව වන දළ දේශීය වියදම (GDE) මඟිනි. දළ දේශීය වියදම 1998 වර්ෂයේදී සියයට 13 ක වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් බිලියන 1,080 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

1998 දී පරිභෝජන වියදම රුපියල් බිලියන 823 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය 1997 දී වූ රුපියල් බිලියන 736 ට වඩා සියයට 12 ක වර්ධනයකි. සමස්ත පරිභෝජන වියදමෙන් සියයට 87 කට දයක වූ පෞද්ගලික පාරිභෝගික වියදම සියයට 12.4 කින් වර්ධනය වෙමින් 1997 වර්ෂයේදී රුපියල් බිලියන 644 සිට 1998 වර්ෂයේදී රුපියල් බිලියන 724 ක් දක්වා වැඩිවිය. පෞද්ගලික පරිභෝජන වියදම ඉහළයාමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ රැකියා අවස්ථාවන් ඉහළයාම, මූර්ත වැටුප් මට්ටම ඉහළ යාම සහ විදේශ රටවලින් ලැබෙන පෞද්ගලික ප්‍රේෂණ ඉහළ යාම වැනි කරුණු නිසා වැයකළ හැකි ආදායමේ වූ ඉහළ යාමයි. ආනයනික භාණ්ඩ සහ සාධක නොවන සේවා සඳහා වන පෞද්ගලික පරිභෝජන වියදම 1998 වර්ෂයේ දී, 1997 වර්ෂයට වඩා මදක් අඩු අනුපාතයකින් ඉහළ ගියේය. යතුරුපැදි, මෝටර් රථ සහ ගෘහ උපකරණ වැනි කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ සඳහා කෙරෙන වියදම 1997 වර්ෂයට වඩා වැඩි අනුපාතයකින් ඉහළ ගියේය. ආහාර සහ පාන වර්ග කාණ්ඩයේ ආනයනිත කිරි නිෂ්පාදිත, ධාන්‍ය සහ පලතුරු සඳහා වන වියදම සැලකියයුතු අන්දමින් ඉහළ ගිය අතර, දේශීය නිෂ්පාදන සැලකියයුතු අන්දමින් ඉහළ ගිය බැවින් ආනයනිත සහල් සහ මාළු නිෂ්පාදිත සඳහා ආනයනිත වියදම අඩුවිය. 1998 පෞද්ගලික පරිභෝජන වියදමෙහි වැඩිවීමෙන් සියයට 67 කට ආසන්න ප්‍රමාණයකට දායක වී ඇත්තේ දේශීය වශයෙන් නිපදවන භාණ්ඩ හා සේවා සඳහා වන වියදමෙහි වැඩිවීමයි. ආහාර වර්ග අතර සහල්, මාළු සහ සත්ව නිෂ්පාදන සඳහා වන වියදම සැලකියයුතු අන්දමින් ඉහළ ගොස් ඇත. පෙර වර්ෂය සමඟ සසඳන කල කාර්මික නිෂ්පාදන සඳහා වන වියදම වැඩි ප්‍රතිශතයකින් ඉහළ ගොස් ඇති අතර, සැකසූ ආහාර, බීර, ඇඟලුම් සහ පිඟන් භාණ්ඩ මෙම අංශයෙහි සැලකියයුතු වර්ධනයක් පෙන්නම් කළ අයිතමයන් විය.

දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය, 1998 වර්ෂයේදී රුපියල් බිලියන 257 ක් දක්වා සියයට 19 කින් ඉහළ ගිය බවට ඇස්තමේන්තු කර ඇත. පෞද්ගලික ආයෝජන සියයට 19 කින් වර්ධනය වූ අතර, සමස්ත ආයෝජනයෙහි දයකත්වය සියයට 14 ක් පමණක් වූ රාජ්‍ය ආයෝජනය සියයට 18.4 කින් වර්ධනය විය. පෞද්ගලික අංශයේ අවධානය කර්මාන්ත, නිවාස, ඉදිකිරීම්, ප්‍රවාහන සහ සන්නිවේදන යන ප්‍රධාන අංශයන්හි ආයෝජනය කිරීමෙහිලා යොමුවිය. මාර්ග, වාරිමාර්ග හා ජල සම්පාදනය වැනි ආර්ථිකයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම සඳහා රාජ්‍ය ආයෝජන යොද ගැණිනි.

**2.3 සංඛ්‍යා සටහන**

**සම්පත් සංයුතිය සහ උපයෝජනය (1996 ස්ථාවර මිල අනුව )**

| ශීර්ෂය | ප්‍රතිශතාත්මක දයකත්වය | | | ප්‍රතිශතාත්මක වර්ධනය | |
|---|---|---|---|---|---|
| | 1996(අ) | 1997(අ) | 1998 (අ) | 1997 | 1998 |
| 1. මුළු සම්පත් | 100 | 100 | 100 | 7.6 | 6.8 |
| වෙළඳ මිල අනුව ද.දේ.නි. | 69 | 69 | 67 | 6.4 | 4.7 |
| භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන | 31 | 31 | 33 | 10.5 | 11.5 |
| 2. උපයෝගීකරණය | 100 | 100 | 100 | 7.6 | 6.8 |
| පරිභෝජනය | 59 | 59 | 59 | 7.1 | 7.0 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 17 | 16 | 18 | 5.1 | 15.3 |
| රජය | 2 | 2 | 2 | 14.4 | 15.8 |
| පෞද්ගලික අංශය හා රජයේ සංස්ථා | 14 | 14 | 15 | 3.7 | 15.2 |
| තොග වෙනස්වීම් | 0 | 0 | 0 | -92.4 | -30.5 |
| භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන | 24 | 25 | 24 | 11.6 | 1.0 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## 2.4 පවත්නා සම්පත් හා එහි උපයෝජනය

දළ දේශීය නිෂ්පාදිතයෙන් හා ආනයනික භාණ්ඩ සහ සාධක නොවන සේවාවන්ගෙන් (විදේශ සම්පත්) සමන්විත වන ආර්ථිකයේ සමස්ත සම්පත් ප්‍රමාණය 1997 දී වාර්තා කළ රුපියල් බිලියන 1,278 සිට 1998 වර්ෂයේ දී රුපියල් බිලියන 1,445 දක්වා ඉහළ ගොස් ඇත. මෙම රුපියල් බිලියන 166 ක් වූ ඉහළ යාමෙන් රුපියල් බිලියන 124 ක් පවත්නා වෙළෙඳපොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය නිසා වූ අතර, ඉතිරි රුපියල් බිලියන 42 විදේශීය සම්පත්හි ඉහළයාම නිසා සිදුවිය. මුළු සම්පත් ප්‍රමාණයෙන් සියයට 57 ක් පරිභෝජනයට ද, සියයට 18 ක් ප්‍රාග්ධන සම්පාදනයට ද වැය කළ අතර, ශේෂය වූ සියයට 25 භාණ්ඩ හා සාධක නොවන සේවාවන් අපනයනය සඳහා දයක විය. සම්පත් උපයෝගිතා රටාවෙහි දක්නට ලැබුණ, සැලකියයුතු ලක්ෂණයක් වූයේ පරිභෝජනය සඳහා වන කොටසෙහි වූ පහත වැටීම සහ ආයෝජන කොටසෙහි වූ ඉහළ යාමයි.

## 2.5 ජාතික ඉතිරි කිරීම්

දේශීය ඉතිරිකිරීම්වල සහ ශුද්ධ විදේශීය ආදායමේ එකතුව වන ජාතික ඉතිරිකිරීම්, 1997 වර්ෂයේදී වූ රුපියල් බිලියන 191 සිට 1998 වර්ෂයේදී රුපියල් බිලියන 235 දක්වා ඉහළ ගියේය. රුපියල් බිලියන 44 ක් පමණ වන මෙම ඉහළයාමෙන් සියයට 86 ක් සඳහා දයක වී ඇත්තේ දේශීය ඉතිරිකිරීමය. දේශීය ඉතිරිකිරීම් අනුපාතිකය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 17 සිට සියයට 19 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. විදේශ ආදායමෙහි ප්‍රධාන ප්‍රභවය වන ශුද්ධ පෞද්ගලික සංක්‍රාම 1998 වර්ෂයේදී සියයට 17.9 න් ඉහළ ගිය බවට ඇස්තමේන්තු කර ඇති අතර එය රුපියල් බිලියන 55 ක් විය.

මේ අනුව, ජාතික ඉතිරිකිරීම් අනුපාතිකය 1997 වර්ෂයේදී වූ සියයට 21.5 සිට 1998 දී සියයට 23.2 දක්වා ඉහළ ගියේය. මේ අනුව ශ්‍රී ලාංකිකයන්ගේ විදේශ ඉපැයුම්හි ඉතිරිකිරීම්, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4 ක් පමණ වන බව පෙනේ. ලෝක ආර්ථිකයේ පරිහානි තත්ත්වය හා භාණ්ඩ මිල මට්ටම් අසතුටුදයක තත්වයක පැවතීම, විදේශ සේවා නියුක්තියෙහි අනාගතය කෙරෙහි බලපෑ හැකි හෙයින් දේශීය ඉතිරි කිරීම් ඉහළ දැමීම සඳහා අඛණ්ඩව උත්සාහ කළයුතු වෙයි.

**2.4 සංඛ්‍යා සටහන**

**ජාතික ඉතිරි කිරීම් (පවත්නා වෙළෙඳ මිල අනුව)**

රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | 1996(අ) | 1997(අ) | 1998(අ) |
|---|---|---|---|
| 1. වෙළඳ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය | 768,128 | 890,272 | 1,014,504 |
| 2. දේශීය ඉතිරිකිරීම් | 117,691 | 154,237 | 191,889 |
| 3. විදේශීය ශුද්ධ සාධක ආදායම | -11258 | -9409 | -11529 |
| 4. විදේශීය ශුද්ධ පෞද්ගලික පැවරුම් | 39,242 | 46,472 | 54,785 |
| 5. ජාතික ඉතිරිකිරීම් | 145,674 | 191,301 | 235,145 |
| 6. දේශීය ඉතිරිකිරීම් අනුපාතිකය (අංක 2 අංක 1 හි % ලෙස) | 15.3 | 17.3 | 18.9 |
| 7. ජාතික ඉතිරිකිරීම් අනුපාතිකය (අංක 5 අංක 1 හි % ලෙස) | 19.0 | 21.5 | 23.2 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

**විශේෂ සටහන - 4**

### කාර්තුමය ජාතික නිෂ්පාදිත ඇස්තමේන්තු

දළ දේශීය නිෂ්පාදිතය යනු ආර්ථිකය තුළ විවිධාකාර ආර්ථික කටයුතු තුළින් ඇතිකරන ලද නිෂ්පාදිතයේ වටිනාකම හෙවත් ඒ තුළින් උපයන ලද ආදායමයි. දළ ජාතික නිෂ්පාදිත ඇස්තමේන්තු ආර්ථික ක්‍රියාකාරිත්වය පිළිබඳ හරස්කඩ සහ කාල විශ්ලේෂණයන් කිරීමට යොදා ගනියි. ආර්ථිකයේ දිගුකාලීනව සිදුවන ව්‍යුහාත්මක වෙනස්කම් හඳුනාගැනීමට ද මෙම ඇස්තමේන්තු යොදගනු ලබයි. එසේම, ක්‍රියාත්මක කරනු ලබන සාර්ව ආර්ථික ප්‍රතිපත්තීන්ට ආර්ථිකය කොතරම් සංවේදිතාවක් දක්වන්නේද යන්නත් මෙම ඇස්තමේන්තුව භාවිතයෙන් ඇගයිය හැකිය.

1930 ගණන්වල පැවති ලෝක ආර්ථික අවපාතය, ආර්ථික ක්‍රියාකාරිත්වය පිළිබඳ ඇති දත්තවල වටිනාකම අවධාරණය කරන ලදී. මේ තත්ත්වය රටවල් ගණනාවක් ජාතික ආදායම් ඇස්තමේන්තු සකස් කිරීම මෙහෙය විය. 1930 දී ජාතීන්ගේ සන්ධානය විසින් රටවල් 26 ක් සඳහා ජාතික ආදායම් ඇස්තමේන්තු සකස් කොට ඔවුන්ගේ වාර්ෂික ලෝක ආර්ථික සමීක්ෂණ වාර්තාවේ පළ කරන ලදී. සාපේක්ෂ වශයෙන් ස්ථිතික ආර්ථිකයන්ගේ ක්‍රියාකාරිත්වය විශ්ලේෂණය කිරීම සඳහා වාර්ෂික ඇස්තමේන්තු ප්‍රයෝජනවත් වුවත්, එම ඇස්තමේන්තු මගින් වර්ෂයක් ඇතුලත සිදුවන වෙනස්කම් එළිදරව් නොකරන නිසා වඩාත් ගතික ආර්ථිකයන්ගේ ක්‍රියාකාරිත්වය විශ්ලේෂණය කිරීම සඳහා ඒවායින් ලැබෙන ප්‍රයෝජනය සීමිතය. වර්ෂයක් තුළදී ආර්ථිකයකට ආවේණික වූ සෘතුමය වෙනස්කම්වලට අමතරව විවිධාකාර වෙනස්කම් ඇතිවිය හැකිය. ආර්ථික ක්‍රියාකාරිත්වය පිළිබඳව වාර්ෂික ඇස්තමේන්තු සකස්වන තෙක් බලා නොසිට එම ක්‍රියාකාරිත්වය පිළිබඳ නිරන්තර ඇගයීමක් කිරීමට කාර්තුමය ඇස්තමේන්තු මගින් ප්‍රතිපත්ති සම්පාදකයන්ට අවකාශ ලබා දේ. එවැනි ඇගයීමක් ආර්ථික ක්‍රියාකාරිත්වයේ වෙනස්වන සන්ධිස්ථාන ඇත්නම් ඒවා හැඳින ගැනීමටත්, එහිදී යම් යම් ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය නම් ඒවා හඳුන්වා දීමටත් ප්‍රතිපත්ති සම්පාදකයන්ට අවකාශ ලැබේ. ඒ අනුව ආර්ථික ක්‍රියාකාරිත්වය විශ්ලේෂණය කිරීම සඳහා ඇති වාර්ෂික ඇස්තමේන්තුවලට අමතර තොරතුරු කාර්තුමය ඇස්තමේන්තු මගින් ලබා දේ. ඒ නිසා දත්ත එක්රැස් කිරීම සඳහා දියුණු ව්‍යුහයක් ඇති රටවල් විසින් වාර්ෂික ඇස්තමේන්තුවලට අමතරව කාර්තුමය ඇස්තමේන්තු සැකසීම ආරම්භ කර තිබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව 1952 සිට වාර්ෂික ජාතික ආදායම් ඇස්තමේන්තු සකසයි. 1998 වර්ෂයේදී මුල් වරට එම වසරෙහි ප්‍රථම, දෙවන හා තෙවන කාර්තු සඳහා වන කාර්තුමය ඇස්තමේන්තු 1997 සහ 1996 වර්ෂවල සංසන්දනාත්මක ඇස්තමේන්තු සමග පළ කරන ලදී. දැනට පවතින වාර්ෂික ඇස්තමේන්තුවලට අමතරව කාර්තුමය පද්ධතියක් සැකසීමට උත්සාහ ගනු ලැබුයේ ගතික හා තරඟකාරී ආර්ථික වාතාවරණය තුළ ප්‍රතිපත්ති සම්පාදකයන්ගෙන් මෙන්ම ව්‍යාපාරික ප්‍රජාව තුළින් ද ආර්ථික තොරතුරු සඳහා වැඩිවෙමින් පවතින ඉල්ලුම සපුරාලීමයි. එවැනි කාර්තුමය ඇස්තමේන්තු තුළින් ආර්ථික තොරතුරු ඉක්මනින් ලැබෙන නිසා ආර්ථිකයේ කලින් කලට ඇතිවන වෙනස්කම්වලට අනුව අවශ්‍ය ඉක්මන් වෙනස්කම් හඳුන්වාදීමට හැකිවන බැවින් සවිමත් සාර්ව ආර්ථික කළමනාකරණයක් පවත්වා ගතහැකි වෙයි. තවද, කාර්තුමය ඇස්තමේන්තු නිසි කලට ලබාදීම මඟින් සාර්ව ආර්ථික දත්ත සඳහා විදේශීය ආයෝජකයන්ගේ අවශ්‍යතාවන් සපුරාලීමට ද අපේක්ෂා කෙරේ.

නිෂ්පාදනය, ආදායම් උත්පාදනය සහ යෙදවුම් පිරිවැය පිළිබඳ වඩාත් කාලීන ව්‍යුහමය තත්ත්වයන් නියෝජනය වන පරිදි කාර්තුමය ඇස්තමේන්තු 1996 වර්ෂය පදනම් කරගෙන සිදු කරනු ලැබේ. ඒ අනුව 1982 පදනම් වර්ෂය ලෙස ගෙන 1997 සඳහා පළ කරන ලද වාර්ෂික ඇස්තමේන්තු 1996 පදනම් වර්ෂයට අනුව සංශෝධනය කරන ලදී. 1998 වාර්ෂික ඇස්තමේන්තු ද 1996 පදනම් වර්ෂයට අනුව සකස් කරනු ලැබේ. කෙසේ වුවද කිසියම් වර්ෂයක වාර්ෂික ඇස්තමේන්තු අගය සහ කාර්තුමය ඇස්තමේන්තුවල එකතුව එක සමාන නොවිය හැකිය. මෙයට හේතුව කාර්තුමය ඇස්තමේන්තු නිෂ්පාදනය, අලෙවිය, නිර්යාත සහ ආයාත වැනි කෙටිකාලීන සංසන්දනාත්මක දර්ශකයක් මත පදනම් වීමයි. වාර්ෂික ඇස්තමේන්තු සඳහා යොදගනු ලබන ගණකාධිකරණය කරනු ලැබූ දත්ත වැනි තොරතුරු කෙටිකාලීනව ලබාගැනීම අපහසුය.

සමහර අංශවල වාර්ෂික දත්ත සපයා ගැනීමට සැළසුම් කර තිබුණත්, වඩා විශ්වාසදායී කාර්තුමය දත්ත ලබාගැනීම සම්බන්ධයෙන් තරමක මන්දගාමීත්වයක් පවතී. කෙසේ වුවත් දත්ත සම්පාදක ක්‍රියාදමයන්ගේ වැඩිදියුණුවක් ලබාගත හැක්කේ ක්‍රියාකාරිත්වයෙන් හා ක්‍රමික දත්ත සම්පාදනයෙනි. කාර්යක්ෂම දත්ත සම්පාදන ක්‍රියාදමයන් පවතින දියුණු රටවල පවා කාර්තුමය දත්ත සදම්පාදනයේදී පවතින දත්ත උපයෝගී කරගෙන ප්‍රාථමික ඇස්තමේන්තු සකස් කරනු ලබන අතර ඒවා අවසාන ඇස්තමේන්තු ලෙස යොද ගැනීමට පෙර කීප වතාවක් සංශෝධනය කරනු ලැබේ. කාර්තුමය ඇස්තමේන්තු සකසන ආයතන විසින් විවිධ මූලාශ්‍රයන්ගෙන් තොරතුරු සම්පාදනය කර ගැනීමට අමතරව ඒවාට අනුපූරක තොරතුරු සම්පාදනය කරගැනීමට තමන්ගේම නියැදි සමීක්ෂණ පවත්වනු ලැබේ. කාර්තුමය ජාතික ඇස්තමේන්තු සැකසීමේ ඊළඟ පියවර විය යුත්තේ නිෂ්පාදන අංශයේ වියදම් අංශයේ දත්ත සමග ගැලපීමයි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ජගත් ආර්ථික වෙනස්කම් වඩා නිරූපනය වන පරිදි තොරතුරු පදනමක් සකස් කිරීමට සැලසුම් කළ විශේෂ දත්ත බෙදහැරීම් ක්‍රමය හා පොදු දත්ත බෙදහැරීම් ක්‍රමය යටතේ තම සාමාජික රටවල් කාර්තුමය ඇස්තමේන්තු සැකසීමට උනන්දු කරනු ලබයි. එවැනි ක්‍රමයක් කෙටිකාල පරාසයක් තුළ වඩා පුළුල් දත්ත අවශ්‍ය ආයෝජනයන්ගේ සහ පර්යේෂණ ආයතනයන්ගේ අවශ්‍යතාවන් සපුරා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අවශ්‍යතාවන්ට අනුව, තම ආයෝජන අරමුදල් සඳහා ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළවලට ඇතුළුවීමට සැලසුම් කරන රටවල් විසින් විශේෂ දත්ත බෙදහැරීමේ ක්‍රමයට දයක විය යුතුය. ඒ ක්‍රමය යටතේ කාර්තුමය ජාතික ආදායම් ඇස්තමේන්තු සැකසීම අනිවාර්ය වේ. විශේෂිත දත්ත බෙදහැරීම හා පොදු දත්ත බෙදහැරීම යන ක්‍රම දෙක හඳුන්වාදීමට ප්‍රධාන හේතුව වූයේ මැක්සිකන් අර්බුදයයි. අර්බුදයට ප්‍රධාන හේතුව ලෙස සලකන්නේ දුර්වල දත්ත සම්පාදන නිසා ඇති වූ ආර්ථික ක්‍රියාකාරීත්වය පිළිබඳ විනිවිදභාවයේ අඩුකමයි. වඩා කෙටිකාල පරාසයන්ගෙන් යුත් තොරතුරු සැපයුනා නම් එම අර්බුදය මඟ හැරවීමට ඉඩ තිබුනේ යැයි විශ්වාස කරනු ලැබේ.

**ස්ථාවර මිල(1996 = 100) දළ දේශීය නිෂ්පාදිතය : කාර්තුමය ඇස්තමේන්තු දේශීය වර්ධන අනුපාතිකයන් - 1997 සහ 1998**

| | 1997 | | | | 1998 | | | | වාර්ෂික | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අංශය | 1 කාර්තුව | 2 කාර්තුව | 3 කාර්තුව | 4 කාර්තුව | 1 කාර්තුව | 2 කාර්තුව | 3 කාර්තුව | 4 කාර්තුව | 1997 | 1998 |
| කෘෂිකර්මය, දැව ආදී වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තය | -0.5 | 3.6 | 1.9 | 7.5 | 3.5 | 1.0 | -0.4 | 5.6 | 3.0 | 2.5 |
| පතල් හා කැණීම් කටයුතු | 4.6 | 13.7 | 10.8 | -12.3 | -9.7 | -5.9 | -4.9 | 0.0 | 3.8 | -5.4 |
| නිමැවුම් කර්මාන්ත | 9.1 | 10.6 | 10.3 | 6.8 | 7.7 | 6.7 | 7.8 | 3.7 | 9.1 | 6.3 |
| ඉදිකිරීම් | 5.7 | 6.1 | 5.9 | 3.9 | 8.5 | 9.0 | 9.0 | 2.0 | 5.4 | 7.1 |
| සේවා | 5.7 | 7.8 | 8.7 | 6.2 | 6.4 | 4.7 | 5.2 | 4.6 | 7.1 | 5.2 |
| දළ දේශීය නිෂ්පාදිතය | 4.6 | 7.4 | 7.3 | 6.1 | 5.7 | 4.4 | 4.5 | 4.4 | 6.3 | 4.7 |